# පොලිස් ඝාතනවලට එරෙහිව දහස් ගණනක් විරෝධය පාති

## Sri Lanka: Thousands protest against police killings

ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි
2009 අගෝස්තු 18

පොලීසිය විසින් අගෝස්තු 13 තරුනයන් දෙදෙනෙකු මෘග ලෙස මරා දැමීමට එරෙහිව ඉරිදා අඟුලානේ පැවති අවමංගල්‍ය පෙරහැරට 5,000 පමන ජනයා සහභාගි වූහ. මෙම ඝාතන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ වංචනික ''පාතාල ලෝකයට එරෙහි යුද්ධය''ට සම්බන්ධිතව මෑතම පොලිස් ම්ලේච්ඡ ක්‍රියාවන් ය.

විහිලුවක් කල බවට කාන්තාවක් විසින් පැමිනිලි කිරීමෙන් පසු බදාදා රාත්‍රී 10.00ට පමන එම්.බී. දිනේශ් තරංග ප්‍රනාන්දු (22) ධනුෂ්ක උදයංග අපොන්සු (26) අඟුලාන පොලීසිය විසින් අත් අඩංගුවට ගත්තේ ය.



අවමංගල්‍යයට සහභාගි වූ ජනයාගෙන් කොටසක්

දමිත් කුමාර ඩේලි මිරර් පත්‍රයට මෙසේ පැවසීය. ''තරුනයන් දෙන්නා ගේන කොට මා මගේ සිර කුඩුවේ හිටියේ. පස් දෙනෙකුට වැඩි පොලිස් නිලධාරීන් පිරිසක් ඔවුන්ට අතින් පයින් පහර දෙනවා සහ එක එක දේවල්වලින් දමා ගසනවා මා දැක්කා. පසුව අඟුලාන පොලීසියේ ඕඅයිසී නිව්ටන් ආවා. ඔවුන්ව ඕඅයිසී ගේ කාමරයට ගෙන ගියා. ඔවුන්ට පටියකින් පහර දෙන බව හා ගින්දර අරගෙන එන්න කියලා තවත් පොලිස් නිලධාරියෙකුට ඕඅයිසී කෑගහනවා මට ඇහුනා. ඊට පසු ඔහු වරින්වර ඔවුන් පුලුස්සමින් සහ ඔවුන්ට පහර දෙමින් සිටියා.''

තම දරුවන් පොලීසියෙන් අත් අඩංගුවට ගෙන පහර දෙන බව දැනගත් දෙමව්පියෝ බ්‍රහස්පතින්දා රාත්‍රී 1.00 පමන පොලීසියට දිවගියහ. කෙසේ නමුත් දරුවන් බැලීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කල පොලීසිය, පසු දින උදේ එන ලෙස ඔවුන්ට දැනුම් දුන්නේ ය. අලුයම 2.00 පමන තරුනයන් දෙදෙනා පොලීසියෙන් පිටතට ගෙන ගියේ ය. පසු දින උදයේ දිනේශ් ගේ සිරුර පොලීසියේ සිට කිලෝමීටරයක් පමන දුරින් වූ පාලමක් අසල තිබී සොයා ගත් අතර ධනුෂ්කගේ සිරුර මුහුදු වෙරලේ දමා තිබුනි.

මල සිරුරු දෙකේම පපුවෙහි සහ පාදවල වෙඩි වැදුනු තුවාල ගනනාවක් තිබූ බව පශ්චාත් මරන පරීක්ෂනය පැවැත්වූ අධිකරන වෛද්‍ය නිලධාරි සුනිල් කුමාර නිගමනය කලේ ය. එක් අයෙකුගේ මුහුනට වෙඩි පහරක් වැදී තිබුන අතර සිරුරෙහි තැලීම් සලකුනු තිබුනේ ය.

අඟුලාන කම්කරු පන්තික ප්‍රදේශයකි. දිනේශ් සහ ධනුෂ්ක එකම පවුලේ සහෝදරියන් දෙදෙනෙකුගේ පුතුන් ය. දිනේශ් ජීවිකාව සඳහා මාලු වෙළඳම් කලේ

ය. ධනුෂ්ක කායවර්ධන මධ්‍යස්ථානයක උපදේශකයෙකු වූ අතර මහරගම ජාතික තැරුන සේවා සභාවේ වෘත්තීය පාඨමාලාවක් හදාරමින් සිටියේ ය.

පාතාලය මර්දනය කරනවා ද වර්ධනය කරනවා ද?" "යුක්තියේ රාජධානියට යන මාවත මේක ද ?" ඇතුලු සටන් පාඨ ඔවුහු හඬ නැගූහ.

අඟුලාන පොලීසිය ඉදිරිපිට ඇතුලු තවත් ස්ථානවල විරෝධතා උද්ඝෝෂන පැවැත්වූහ. පොලිස්



ධනුෂ්කගේ ශෝකයට පත් පියා අවමංගල්‍ය පෙරහැරේ ගමන් ගනිද්දී

දහසකට අධික කෝපාවිශ්ට ජනයා ඝාතනවලට විරෝධය පලකිරීම සඳහා බ්‍රහස්පතින්දා උදේ පාන්දර පොලීසිය වටකලහ. පොලීසියට ගල්

ගැසූ ජනයා පැය භාගයක් පමන කොලඹ මාතර දුම්රිය මාර්ග අවහිර කරගෙන සිටියහ.

පොලීසිය ආරක්ෂා කිරීමට සහ අඟුලාන පොලිස් ස්ථානාධිපති ජී.වී. නිව්ටන් බේරා ගැනීම සඳහා කැරලි මර්දන පොලීසිය සහ හමුදා භටයෝ වහාම පොලිස් ස්ථානයට පැමිනියහ. තරුනයන් දෙදෙනා පාතාල ලෝකයට සම්බන්ධ බව පෙන්වීමට පොලීසිය පලමුව උත්සාහ කල නමුත් මහජනයා අතර නොසන්සුන්කම දිගටම වර්ධනය වන තතු තුල සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරින් පස්දෙනෙකු අත් අඩංගුවට ගත් බව නිවේදනය කලේ ය. පිරිස විසිර ගියේ ඝාතන සම්බන්ධව ''අපක්ෂපාතී'' පරීක්ෂනයක් පවත්වන බවට ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරියෙකු පොරොන්දු වීමෙන් පසුව පමනි.

අවමංගල්‍යයට පෙර ධනුෂ්ක සේවය කල ලයිෆ් ලයින් ෆිට්නස් සෙන්ටර් ඉදිරිපිට ගාලු පාරේ සියයක පමන පිරිසක් පිකට් උද්ඝෝෂනයක නිරත වූහ. අතින් ලියූ සටන් පාඨ පුවරු ප්‍රදර්ශනය කරමින් "අහිංසකයන් මරා පාතාල ලේබලය ඇලවීම නතර කරනු" "පොලීසිය

ස්ථානය ආරක්ෂා කිරීම සඳහා කැරලි මර්දන පොලිස් සහ පොලිස් කොමාන්ඩෝ භටයන් ඇතුලු සිය ගනනක් කැඳවනු ලැබ සිටයහ. දිනේශ්ගේ නිවසින් අවමඟුල් පෙරහැර ආරම්භ වූ අතර, අතර මගදී ජනයා ඕඅයිසී නිව්ටන් ගේ පඹයෙකු පිලිස්සූහ.

දිනේශ්ගේ පියා, එම්.බී. සංගදාස ප්‍රනාන්දු *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසීය: "මෙම තරුනයන් දෙදෙනා පාතාල ලෝකයේ සාමාජිකයන් කියලා ලේබල් අලවන්න පොලීසිය උත්සාහ කලා. ඔවුන් අහිසකයෝ, දිනේශ් සාමාන්‍යපෙල දක්වා ඉගෙන ගත්තා. වෙනත් රැකියාවක් සොයා ගන්න බැරිවුන නිසා ඔහු මාලු වික්කා. පොලීසිය ඇයි මේ අපරාධය කලේ ? අපට අවශ්‍යයි ඔවුන්ට දඬුවම් කරලා අපේ ලමයින්ට සාධාරනය ඉෂ්ට කිරීම. මේ විධිහෙ අපරාධ නතර කල යුතුයි. පොලීසියට උවමනා විධිහට ක්‍රියා කරන්න බලය දීලා තියෙන නිසා ආන්ඩුව මේ අපරාධයට වගකිව යුතුයි.''

වඩු කාර්මිකයෙකු වූ ධනුෂ්කගේ පියා ජී.එම්. සමන් උදයකාන්ත අපොන්සු: ''මගේ පුතා උසස්පෙල දක්වා ඉගෙන ගත්තා. එයා ක්‍රීඩාවලට කැමතියි. ඒ අංශයෙන් ඉදිරියට යන්න එයාට අවශ්‍ය වුනා. එයා කසාද බැඳලා සතුටින් ජීවත් වෙනවා දකින්න මා

සිහින දැක්කා. මගේ ඔක්කොම බලාපොරොත්තු බිඳ වැටිලා. පරීක්ෂනවලින් අපේ දරුවන්ට සාදාරනයක් ඉෂ්ට වෙයි කියලා විශ්වාසයක් නැහැ.

ජාතික තරුන සේවා සභාවේ ධනුෂ්කගේ සමකාලීන ශිෂ්‍යයෙක් ඔහු කාන්තාවකට විහිලු කල බවට නගා ඇති චෝදනාව හෙලා දුටුවේ ය. ''මෙයා හරිම විනයගරුක ශිෂ්‍යයෙක්. එයාගේ මරනය අපට විශාල පාඩුවක්. පාතාලය විනාශ කිරීමේ නමින් ආන්ඩුව දීලා තියෙන බලය පාවිච්චි කරමින් පොලීසිය තමන්ට කැමති විධිහට ක්‍රියා කරනවා. මෙය නතර කල යුතුයි. මේ විධියට දිගටම සිද්ධ වුනොත් නීතිය තමන්ගේ අතට ගන්න මහජනයාට බල කෙරේවි.'' ඔහු ප්‍රකාශ කලේ ය.

වෙලා නැහැ. මිනිස්සුන්ට ආන්ඩුවේ පොරොන්දු විශ්වාස කරන්න බැහැ. ඒ නිසා මා හිතන්නේ සමාජය තුල මේ ඝාතන සම්බන්ධව සංවාදයක් ඇතිවිය යුතුයි. නීතියට පිටින් කෙරෙන මේ ඝාතන නතර කිරීම සඳහා මහ ජනතාව මූලිකත්වය ගත යුතුයි.''

ලයිෆ් ලයින් ෆිට්නස් සෙන්ටර් අයිතිකරු: ''ධනුෂ්ක මගේ ජිම් එකේ වැඩ කලා. ඔහුගේ අපේක්ෂාවන්ට ඔහු තදින්ම කැපවී සිටියා. දැන් එයා අපට අහිමි වෙලා. යුද්ධය ඉවර වුනාට පස්සේ සාමය එයි කියලා මිනිස්සු හිතුවා. නමුත් ඒක එහෙම නෙමෙයි කියලා මේ මරනවලින් පෙනෙනවා. ආන්ඩුව රාජ්‍ය ත්‍රස්තය උතුරෙන් දකුනට ගෙනෙමින් ඉන්නවා. මෙය නතර කල යුතුයි. මේ අහිංසක තරුනයන්ට සාධාරනය ඉෂ්ට වන තුරු අප අපේ උද්ඝෝෂනය දිගටම කරගෙන යනවා.''



කැරලි මර්දන පොලීසිය අගුලාන පොලීසිය ආරක්ෂා කරයි

ප්‍රදේශයේ පදිංචිකරුවෙකු ලෝක සමාජවාදී වෙබ් අඩවියට මෙසේ පැවසීය: ''මේක පලමුවන හෝ අවසාන සිද්ධිය නොවෙයි. මේක හුදෙක් ඕඅයිසී නිව්ටන් පමනක් සම්බන්ධ ප්‍රශ්නයක් නෙමෙයි. මේක මේ රටේ ජනයාට එරෙහිව කරන පොලිස් ත්‍රස්තයක්. අද මට හෙට ඔබට වෙන්න පුලුවන්. පාලක පන්තිය මර්දනය දියත් කරලා තියෙන්නෙ සමස්ත සමාජයට ම විරුද්ධව. එල්ටීටීඊ එකට විරුද්ධව යුද්ධය මැද්දැවෙ ආන්ඩුව සමස්ථ සමාජයටම විරුද්ධව ත්‍රස්තය මුදා හැරියා.

''රට තුල ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. පසුගිය දිනවල කොපමන සංඛ්‍යාවක් මිනිස්සු මරලා තියෙනව ද? පොලීසිය ඔවුන් මරලා පාතාල ලෝකේ කියලා කියනවා. මාධ්‍යවේදීන් කී දෙනෙක් මැරුවද? ආන්ඩුව අපක්ෂපාතී පරීක්ෂන පොරොන්දු වුනාට කිසිම දෙයක්

තරුනයන් දෙදෙනාගේ ඝාතනය හුදකලා සිද්ධියක් නොවෙයි. එල්ටීටීඊයට විරුද්ධ යුද්ධය කාල පරිච්ඡේදය තුල ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් ක්‍රියාත්මක වූ ඝාතක කල්ලි ආන්ඩුවේ ආශීර්වාදය ඇතිව සිය ගනනක් පැහැරගෙන ගොස් මරා දැමූහ. මෙසේ මරා දැමූවන් අතර මාධ්‍යවේදීහු සහ විරුද්ධ දේශපාලනඥයෝ ද වූහ. මහ ජනතාවට එරෙහිව එල්ල කර ඇති ත්‍රස්ත උද්ඝෝෂනයක කොටසක් ලෙස ආන්ඩුව දැන් ''පාතාලයට විරුද්ධව යුද්ධය'' ආරම්භ කර තිබේ.

අගෝස්තු 6 මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂනික ආයතනයේ ශිෂ්‍යයෙකු වූ නිපුන රාමනායක පොලිස් කන්ඩායමක් විසින් පැහැරගෙන ගියේ ය.

නිපුනට අනුව කොලඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂ වාස් ගුනවර්ධනගේ පුතා සහ පොලිස් නිලධාරින් කිහිප දෙනෙකු විසින් ඔහුට පහර දෙන ලදී.

පසුව ඔහුව පොලීසියට ගෙනැවිත් පාතාල ලෝකයේ පුද්ගලයකු සමඟ සම්බන්ධ බවට ප්‍රකාශනයක් අත්සන් කිරීමට බල කලේ ය. නිපුනගේ මව මැදිහත් වීමෙන් ප්‍රකාශයට අත්සන් කිරීම වැලකුනි. වරද කරුවන්ට එරෙහිව දඬුවම් පමුනුවන ලෙස ඉල්ලමින් අගෝස්තු 10 ශ්‍රී ලංකා තොරතුරු සහ තාක්ෂන ආයතනයේ සිසුහු ආයතනය ඉදිරිපිට උද්ඝෝෂනයක නිරත වූහ.



ලයන් ලයින් සෙන්ටර් ඉදිරිපිට විරෝධතා උද්ඝෝෂණය

සිද්ධිය යටපත් කිරීම සඳහා ''කඩිනම් පියවර'' ගන්නා ලෙස ජනාධිපති රාජපක්ෂ නියෝග කලේ ය. පොලිස් ප්‍රධානියා ඇතුලු කිහිප දෙනෙකු පොලිස් මූලස්ථානයට සහ තවත් ස්ථානවලට මාරු කලේ ය. නමුත් කිසිවෙකුට විරුද්ධව චෝදනා ගොනු කර නැත.

ආන්ඩුව සහ පොලීසිය කෙරෙහි මහජන කෝපය ඉවත හැරවීම සඳහා ආන්ඩුවේ ඩේලි නිව්ස් පත්‍රය සෙනසුරාදා කතුවැකියක් ලිවීය: ''සේවාව තුල සිටින අයහපත් පුද්ගලයන් කීපදෙනෙකුට කවර හේතුවක් නිසාවත් සමස්ථයක් ලෙස පොලීසියේ කීර්තිනාමය පලුදු කිරීමට පොලිස්පතිවරයා සහ ජ්‍යෙෂ්ට නිලධාරින් ඉඩ නොදිය යුතුයි... පොලීසිය ඔවුන්ගේ කීර්තිනාමය කැත කරන පුද්ගලයින් උගුල්ලා දැමිය යුතුයි. පැයේ අවශ්‍යතාවය වන්නේ පිරිසිදු පොලීසියක් ය.''

එදිනම සමාන ආකාරයේ කතුවැකියක් අයිලන්ඩ් පත්‍රය ලිවීය: සත්තකින්ම දෙපාර්තමේන්තුව තුල යහපත් නිලධාරීහු සහ මිනිස්සු සිටිති. නමුත් ඔවුන්ගේ නොහික්මුනු සමපාර්ශ්වකරුවෝ නීතියේ ආරක්ෂකයන්ගේ ප්‍රතිමූර්තිය පිලිසකර කල නොහැකි ආකාරයට බිඳ දමා ඇත.''

පොලීසියේ ත්‍රස්ත උද්ඝෝෂනය ආන්ඩුවේ අනුමැතිය ලත් පොලීසියක් විසින් කරන දෙයක් මිස පොලිස්කාරයන් කිහිප දෙනෙකුගේ නොහික්මුනු ක්‍රියාවක් නොවේ; මාධ්‍ය ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන පසුගිය බ්‍රහස්පතින්දා නීතියට පිටින් කෙරෙන ඝාතන නැවත යුක්ති සහගත කලේ ය. ''ජාතියේ යහපත සඳහා කරනු ලබන සමහර දේවල් අනියම් ආකාරයට කරන්න සිද්ධ වෙනවා. සමහර අයව අපහසුතාවයට පත් කරනු ලබනවා''ඔහු කීවේ ය.

රාජපක්ෂගේ ''පාතාල ලෝකයට විරුද්ධ යුද්ධය'' සමස්ථයක් ලෙස කම්කරු පන්තිය මත ගැඹුරු ප්‍රහාරයන් එල්ල කිරීමට සූදානම් වීමකි.රට තුල ගැඹුරුවන ආර්ථික අර්බුදයේ බර කම්කරු පන්තිය මත පැටවීම සඳහා තවත් යුද්ධයක් - රට ගොඩනැගීමේ ආර්ථික යුද්ධයක් - ජනාධිපති විසින් දැනටමත් ප්‍රකාශයට පත්කර ඇත. විසි පස් වසරක් පුරා සිවිල් යුද්ධය තුල ගොඩනැගූ පොලිස් රාජ්‍ය උපකරන තමන්ගේ ජීවන තත්ත්වයන් ආරක්ෂා කර ගැනීමට යත්න දරන තරුනයන්, කම්කරුවන් හා දුගීන්ට එරෙහිව හරවනු ඇත.



© www.wsws.org